# සැලසුම් කළ බිමේ සෞ

අප අවට පරිසරය ස්වභාවධර්මයට ගැළපෙන අයුරින් ස්වභාවික පරිසරයේ පවතින ජීවී ද්‍රව්‍ය හෙවත් ශාකමය ද්‍රව්‍ය සහ අප විසින් නිර්මාණය කරන ලද අජීවී ද්‍රව්‍ය උපයෝගි කරගෙන ඉතාමත් අලංකාර ලෙස කලාත්මක වූත් විද්‍යාත්මක වූත් මූලධාර්මානුකූලව ප්‍රියමනාප අයුරින් භූමිය නිර්මාණය කර ගැනිම උද්‍යාන නිර්මාණකරනයයි.

ස්වභාවික පරිසරයක පිහිටන සුන්දරත්වය හා එහි පාරිසරික සාධක සංකලනය කරමින් මෙම නිර්මාණ ක්‍රමවේදය මිනිසා පරිහරණය කරන භූමියට යොදා ගැනීමෙන් මානව ප්‍රජාවට යහපත් පරිසරයකට උරුමකම් ලබාදිය හැකිය. එලෙසම නිසි පරිදි තම උද්‍යානය නිර්මාණය කර ගැනීම තුළින් මානසික තෘප්තිමත් භාවයද ළඟා කරගත හැකිය. එම ප්‍රතිලාභය මිල මුදලින් මැනිය නොහැකිය. ඒ නිසා වර්තමානයේ බොහෝ දෙනෙකු උද්‍යාන අලංකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර තිබීම සතුටට කරුණකි.

නිසි පරිදි සැලසුම් කරන ලද උද්‍යානයකින් ලැබෙන්නා වු ප්‍රයෝජන අප්‍රමාණය. තුරුලතා සහිත පරිසරයක් සමඟ ගත කරන්නා වු ජීවිත ඉතාම සුවදායකය, සුන්දරය. මෙය හුදෙක්ම විනෝදාංශයක් ලෙස නිරත විය හැකි කාර්යයකි. අධ්‍යයනය කිරීමට යම් ප්‍රමාණයක් පැවතුන ද තමන්ගේ මුලික දැනුමකින් මෙම නිර්මාණකරනයට ප්‍රවිෂ්ට විය හැකිය. නමුත් ස්වභාවික ශාක හා කෘතිම උද්‍යාන අලංකරණ බිම් භාවිතය හා ඒවා පරිසරයට උචිත අයුරින් ගැලපිය යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය කළ යුතුය. ඔබ විසින් ගොඩනගන ලද නිවසට හෝ ගොඩනැගිල්ලට භූමි නිර්මාණයක්





# ...ාඳුරු අසිරිය මැවේ

සැලසුම් කිරීමට ඔබට වුවද දැඩි අවශ්‍යතාවයක් තිබෙනු ඇත. එමඟින් නිවහනත්, අවට පරිසරයත්, පරිසරයෙහි අලංකාර බවත්, චමත්කාරයත් හේතුවෙන් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබෙනු ඇත. නිවස අවට අවම සම්පත් පරිහරණය කරමින් සුලු ඉඩකඩකට වුවද අලංකාර උද්‍යාන නිර්මාණ ක්‍රමවේදයන් සකස් කළ හැකිය. දෙනෙතට සිසිලක් ගෙන එන සිසිල් වර්ණ වලින් තමන්ගේ  අවශ්‍යතාව, ආශාව ඕනෑම ආකාරයකට පරිහරණය කරමින් උද්‍යාන නිර්මාණ සැලසුම් කර ගත හැකිය.

උද්‍යාන නිර්මාණය  යනු කලාවකි. චිත්‍රයකි. තම සිතෙහි මතුවන සිතුවිලි ප්‍රායෝගිකව අලංකාර ලෙස ක්‍රියාවට නැගීමකි. සෞන්දර්යාත්මකව ඇගයීමට ලක් කළ හැකි පරිසරයට සංවේදී නිර්මාණශීලී පුද්ගලයෙකුට ඕනෑම නිර්මාණයක් නිදහසේ සිතුවිලි ගොඩනගා ගෙන කලාත්මකව සැලසුම් කළ හැකිය. මෙම පුද්ගලයා එවිට උද්‍යාන නිර්මාණ සැලසුම් ශිල්පියෙකි.

පිරිසිදු වාතාශ්‍රය ලබාගත හැකි වනුයේ තුරුලතා මඟිනි. ශාක, නිවාස තුළ භාවිතා කිරීමෙන් අභ්‍යන්තර අලංකාරයත් ශාක නිවාස පිටත භාවිතා කිරීමෙන් බාහිර අලංකාරයත් යනුවෙන් හැඳින්විය හැකිය. නාගරික පරිසරය තුළ ජීවත්වන්නාවූ බොහෝ දෙනෙකුට ඉඩකඩ මදිකම නිසාම ශාකවල පැවැත්ම ගැන අවධානය යොමු නොකරයි. නමුත් අප කළ යුතු වන්නේ අපගේ පැවැත්මට සෘජු ලෙසම බලපාන ශාක අපගේ ඉදිකිරීම් හා සම්බන්ධ කරගැනීමයි. සියළුම සංවර්ධන ව්‍යාපෘති සඳහා ශාකමය ද්‍රව්‍ය භාවිතා කිරීමට අනිවාර්‍යයෙන් සැලසුම් කළ යුතුයි.





තෘණ පිට්ටනි මගින් අලංකාරයක් උද්‍යානයට ලැබුණද පාංශු සංරක්ෂණ කටයුතු සඳහා තෘණ වර්ග හා බිම් ආවරණ ශාක භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. විශාල වශයෙන් සෝදා පාලුවට ලක්වන ස්ථාන වලට භූමි අලංකරණ ක්‍රම හඳුන්වා දීමේදී පිඩලි යෙදිම හා උචිත ශාක භාවිතා කිරීම මගින් එම බිමෙහි සිදුවන පාංශු ඛාදනයෙන් ආරක්ෂා කිරීමට හැකියාව ලැබෙනු ඇත. නිවසක පිහිටන තෘණ පිට්ටනියකින් මතුපිට ලැබෙන්නාවූ මෘදු බව ඉතාමත්ම වැදගත්ය. තවද උද්‍යානය තුළ තිබෙන දූවිලි වලට නිවැරදි විසඳුම තෘණ මගින් ලබා දිය හැකිය.



උද්‍යානයක් තුළ ශාක සිටුවීමේදී විවිධ අයුරින් තුරුලතා භාවිතා කරයි. උද්‍යානයට අවශ්‍ය සෙවන ලබා ගැනීම ඉතා වැදගත් වේ. නිවසක් තුළ ලැබෙන්නේ කෘත්‍රිම සෙවනකි.නමුත් ශාකයකින් ලැබෙන්නේ ස්වභාවික සෙවනකි.උද්‍යානයට ශාකයක් හඳුන්වා දීමෙන් අප සිදු කරන්නේ ලැබෙන ආලෝකය පාලනය කිරීමකි.මල් පිපෙන හෝ මල් නොපිපෙන ශාක භාවිතා කිරීමෙන් පරිසරයේ අලංකාරය හා වටිනාකමද ලඟා කරගත හැකිය.

අධික ශබ්දයද අපට බාධාවකි. එයට විසඳුමක් ලෙස ශාක භාවිතා කළ හැකිය. ශාක මගින් ශබ්ද අවශෝෂණය කරනු ලබයි. පරිසරයේ සෝෂාකාරී බව නැති කිරීමට මෙන්ම පරිසරයේ දුගඳ ඉවත් කිරීමටද අප යොදාගන්නා වූ ශාක ඉතාමත් වැදගත් වේ. ප්‍රධාන නගර ආශ්‍රිතව ජීවත් වන පිරිස් සඳහා ශාක ආවරණ භාවිතා කිරීම මගින් විශාල පාරිසරික අවශ්‍යතාවයන් ඉෂ්ඨ කරගත හැකිය.

ශාක කොටස් කෙසේ භාවිතා කළද ශාක සංරක්ෂණ ක්‍රියාවලියට සෘජුවම එය දායක වෙයි. පැළෑටියක්, පඳුරක්, ගසක් වැලක්, බිම් ආවරණයක් වැනි කුමන හෝ අයුරකින් මෙම පරිසරයට එය සංරක්ෂණ ක්‍රියාවලියකි.



උද්‍යාන තුළ ඇති සුන්දරත්වය විඳින අතරතුර ශාක සමඟ කාලය ගත කිරීමෙන් මානසික පීඩනයද අවම තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට පිළිවන. සිත සැහැල්ලුවට පත්කර ගැනීමෙන් ලැබෙන ආශ්වාදය උද්‍යාන නිර්මාණකරණයේ වැදගත්කමක් ලෙස මෙම ආකාරයට සඳහන් කළද මෙහි මූලධර්මානුකූලව සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීමත්, ඒ ඒ ප්‍රදේශ වලට උචිත පැළ වර්ග තෝරා ගැනීමත්, විවිධ වූ උද්‍යාන නිර්මාණ අංග පිළිබඳ දැනුම ලබා ගැනීමටත් අවස්ථාව ලබාගත යුතුව ඇත. ඉදිරියේදී ඒ පිළිබඳ මෙවැනි ලිපි පෙලකින් ඔබව දැනුවත් කිරීමට කටයුතු කෙරෙනු ඇත.



සැලසුම් කල බිමේ
සොඳුරු අසිරිය මවන්නේ . . . . . .

චමින්ද රත්නායක,
කෘෂිකර්ම උපදේශක,
රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය